
DREAMWORLD
MARCH 2024
ප්‍රේක්ෂකයන්ගෙන් ටිකක් නෙමෙයි ගොඩක් බැනුම් අහපු අම්මා කෙනෙක්
නිර්මාණ කියන්නෙ දරුවෝ වගේ
මම උපරිමයෙන්ම උත්සාහ කලේ අද shoot එකට වඩා හෙට කරන එක හොඳට කරන්න
මම පොඩි කාලේ ඉඳන් සිනමාවට මාර විදිහට ආදරය කරනවා
EXCLUSIVE!
TALK WITH
MADUSHANI
Wickramasinghe

# DREAMY WORLD

EDITORIAL

EDITOR IN CHIEF
Chitral de Mel

PRODUCTION
Boston Lanka, USA

COVER & LAYOUT
Piumi Mahazoom

MODEL PHOTOGRAPHY
Dinesh Nuwan
Lanka Wanigasekera

WRITERS
Melanie Fresankothen

CONTACT US

bostonlankanews@gmail.com

# CONTENT

## MARCH EDITION 2024


ප්‍රේක්ෂකයන්ගෙන් ටිකක්
නෙමෙයි ගොඩක් බැනුම්
අහපු අම්මා කෙනෙක්

මම උපරිමයෙන්ම උත්සාහ කලේ
අද shoot එකට වඩා හෙට කරන
එක හොඳට කරන්න

මොකද රිලීස් උනාට පස්සේ සතියක්
විතර  සමාජ මාධ්‍ය ජාලවල මගේ
ෂූට් එක වයිරල් වෙනවා

අධ්‍යක්ෂකවරයත් තිර පිටපත් රචකයත්
කියන්නේ අම්මා කෙනෙක් තාත්තා කෙනෙක්
වගේ. නිර්මාණ කියන්නේ දරුවෝ වගේ.

රංගන ශිල්පියෙක් වෙන්න
කලින් මං නිරූපණ ශිල්පියෙක්

Red Carpet හි පරමාර්ථය ක්ෂේත්‍රයේ
ඉදිරියට යන්න උත්සාහ කරන
තරුණියන්ට අවස්ථාවක් ලබාදීම



# ප්‍රේක්ෂකයන්ගෙන් ටිකක් නෙමෙයි ගොඩක් බැනුම් අහපු අම්මා කෙනෙක්

## අංජලී ලියනගේ

**ඉතින් අංජලි කොහොමද මේ දවස්වල?**

පහුගිය දවස් ටිකේ නම් චුට්ටක් විවේකයක් ලැබිලා තිබුණා. දැනුත් ලොකු කාර්යබහුලත්වයක් නෑ. සුපුරුදු වැඩ කටයුතු කරගෙන යනවා ලොකු විවේක කාලයක් ගත්තා. දැන් ආපහු වැඩ කරන්න පටන් ගත්තා. මේ දවස් ටිකේ නම් කාර්යබහුල  නෑ. සාමාන්‍ය විදිහට රූගත කිරීම් එක්ක ඉන්නවා.

**හිතලඟ හිණැහුණා ටෙලි නාට්‍යයෙන් තමයි ඔයා මේ දවස්වල ගොඩාක් ප්‍රේක්ෂකයන් අතරට එන්නේ ඒ ගැනත් කියමු..**

ඔව්..ඇත්තටම හිත ළඟ හිනැහුනා ටෙලි නාට්‍ය හිතුවටත් වැඩිය මට ප්‍රේක්ෂක ප්‍රතිචාර ලැබුණා. සුපුරුදු විදිහට ඒකෙත් මගේ චරිතය අම්මා. වෙනත් අම්මා චරිත වලට වැඩිය මේක ටිකක් වෙනස් චරිතයක් වුණා. ප්‍රේක්ෂකයන්ගෙන් ටිකක් නෙමෙයි ගොඩක් බැනුම් අහපු අම්මා කෙනෙක්. දරුවන්ගේ සිතිවිලි ගැන හිතන්නැතුව පොඩ්ඩක් ආත්මාර්ථකාමී වෙලා ඇගේ තීරණ වලට වැඩ කරන්න ගිහින් තමන්ගේ දුවගේ හිත රිද්දනවා. දුවගේ ආසාවන් ගැන හිතන්නේ නැතුව පටු අදහස් එක්ක ජීවත් වෙන අම්මා කෙනෙක්ගේ චරිතයක් ඒක.

ගොඩක් ආසාවෙන් කරපු චරිතයක් තමා හිත ළඟ හිත ළඟ හිනැහුනා ටෙලි නාට්‍යයේ ලලාගේ චරිතය. ලංකාවේ විතරක් නෙමෙයි පිටරට ප්‍රේක්ෂකයොත් ටෙලි නාට්‍යය ගැන කතා කරද්දි හරි සතුටුයි. ලලා කියන චරිතය මට සාර්ථක කර ගන්න පුළුවන් වුන විශේෂම හේතුව තමයි මෙහි පිටපත. එය  රචනා කලේ මහේෂ් රත්සර මදුමාරච්චි මහත්මයා.







# අපිට නිෂ්පාදනය පැත්තෙන් නිෂ්පාදකවරු ලැබෙනවා නම් හොඳ නිර්මාණ කරන්න පුළුවන්

ඔහු මොන කතාවක් ලිව්වත් ඒක ප්‍රේක්ෂකයන්ගේ ආදරේට පාත්‍ර වෙනවා. මේ ටෙලි නාට්‍යය අධ්‍යක්ෂණය කරන්නේ ප්‍රදීප් රසාංග මහත්මයා. අපිව හරි විදියට අධ්‍යක්ෂණය වෙනකොට අපෙන් උපරිම දේ එලියට එනවා. ඒ වගේම ඒ ටෙලි නාට්‍යයේ අපිත් එක්ක එකට වැඩ කරන රංගන ශිල්පීන් ශිල්පිනියන් එයාලගේ සහයෝගයත් ගොඩක් උදව්වක් වුණා. ඇහැට කඳුළක් ආවා රූගත කිරීම් කරපු ඒ අවසාන දවසේ. හරිම ලස්සන අත්දැකීම් ගොඩාක් හම්බුණා.

**ක්ෂේත්‍රයට ඔයා ආපු ඒ ගමන් මඟ ගැනත් මතක් කරමු.**

ඇත්තටම මේ වෙනකොට මං ක්ෂේත්‍රයට ඇවිල්ලා අවුරුදු විස්සක් විතර වෙනවා. මං හරි හිමින් ගමනක් තමයි ආවේ හැබැයි මං තව චරිත කරන පිපාසය තියෙනවා. මං ආසයි විවිධ චරිත කරන්න. මම ආසයි ඉදිරියේදී විවිධ චරිත වලට රංගනයෙන් දායක වෙන්න. මේක හරි ගෞරවනීය හැමෝටම කරන්න බැරි එන්න බැරි හරි සුන්දර ක්ෂේත්‍රයක්. මේ ක්ෂේත්‍රයට එන්නත් ලොකු වාසනාවක් තියෙන්න ඕනේ. මොකද ඒ ප්‍රේක්ෂකයන්ගේ ආදරය ගෞරවය දිනාගන්න. ඒවට හරි ආසයි. ඒක තමයි වටිනාම දේ රංගන ශිල්පියෙකුට ශිල්පිනියකට. ඒ වගේම මේ ආව ගමනේදී ප්‍රවීනයන්ගෙන් ලොකු ආදර්ශයක් මට ලැබුණා.

මම රංගනය කියන දේ දුකට හදාරපු කෙනෙක් නෙමෙයි අනෝජා වීරසිංහ මහත්මිය ළඟ පොඩි කාලයක් මම රංගනය හැදෑරුවා. මම රංගනයෙන් දායක වුණා හැම ටෙලි නාට්‍යයකම වගේ ප්‍රවීණයන් එක්ක වැඩ කරන්න මට ලැබුණා. එයාල ලබා දුන්න උපදෙස් මගේ ජීවිතයට මාර වටිනවා.



**ගොඩාක්ම කැමති පුංචි තිරයටද?**

ඔව්.. මම ගොඩක් කැමති පුංචි තිරයට. මොකද මං ආවේ පුංචි තිරයෙන්. මෙච්චර කාලයක් රැඳුනේ පුංචි තිරයේ. නමුත් සිනමාවේ මම නිර්මාණ දෙක තුනකට සම්බන්ධ වෙන්න අවස්ථාව ලැබිලා තියෙනවා. ඒ වගේම වේදිකාවෙත්. වැඩියෙන්ම කැමති පුංචි තිරයට.

**ඔයාගේ පවුල ගැනත් පුංචි විස්තරයක් කියමු.**

මගේ පවුල ගැන කියනවනම් මගේ උපන් ගම ගල්කිස්ස. මම පාසල් ගියේ ගල්කිස්ස උසස් බාලිකා විද්‍යාලයට. මගේ පවුලේ අම්මයි තාත්තයි නංගිලා දෙන්නයි මමයි ඉන්නේ දැනට තාත්තා ජීවතුන් අතර නැහැ. ඔහු ශ්‍රී ලංකා වරායේ ප්‍රධාන ලිපිකරුවෙකු විදිහට සේවය කළා. නංගිලා දෙන්නා විදෙස්ගත වෙලා ඉන්නේ. මට දියණියක් ඉන්නවා. මගේ මහත්තයත් තරිඳු පෙරේරා. ඔහු ගායන ශිල්පියෙක් වගේම වාදන ශිල්පියෙක්. අපි හරි සාමාන්‍ය විදිහට ජීවත්වෙන සාමාන්‍ය පවුලක්.

**වර්තමාන ටෙලිනාට්‍ය ක්ෂේත්‍රය ගැන මොකක්ද ඔයාගේ අදහස?**

මේ වෙනකොට හොඳ හරයෙන් යුතු ටෙලි නාට්‍ය හැදෙනවා. අපිට හොඳ අධ්‍යක්ෂකවරු ඉන්නවා. පිටපත් රචකයන් ඉන්නවා. ඒ වගේම හොඳ රංග හැකියාවන් තියෙන නළු පිරිසක් ඉන්නවා. අපිට අපිට නිෂ්පාදනය පැත්තෙන් නිෂ්පාදකවරු ලැබෙනවා නම් හොඳ නිර්මාණ කරන්න පුළුවන්. ඇත්තටම අපේ රටේ සම්පත් හැම දෙයක්ම තියෙනවා. මේ වෙනකොට අපේ ලාංකිය චිත්‍රපටිවලට පවා පිටරටින් අපිට සම්මාන ලැබෙනව ඒ වගේ දක්ෂයෝ පිරිසක් ඉන්නවා මේ වෙනකොටත් හොඳ නිර්මාණ බිහිවෙලා තියෙනවා මේ වගේ නිර්මාණ තවදුරටත් බිහි වෙන්න නම්

අපිට හොඳ දෙයක් එළියට දාන්න පුලුවන්නම් හොදයි. මේ වෙනකොට ටෙලි නාට්‍ය ක්ෂේත්‍රය හොඳ තැනකට ඇවිල්ලා තියෙනවා.

**ටෙලිනාට්‍ය වලදී නවකයන් එක්ක ගත කරන ඒ හෝරාවන් ඔයාට එකතු කරන්නේ මොනවගේ අත්දැකිමක්ද?**

ඇත්තටම මට මේ දවස්වල ගොඩක් නව පරපුරේ අයත් එක්ක තමයි වැඩ කරන්න ලැබෙන්නේ. දක්ෂ පිරිසක් ඉන්නවා. එයාලා හරිම සබකෝලයක් නැතිව හොඳ රංගනයක් ඉදිරිපත් කරනවා. ඔවුන් රංගනය හදාරනවා ඒ වගේම කියන්න ඕන දෙයක් තමයි තමන් භාරගන්න මොන චරිතයක් වුණත් ඒකට සාධාරණයක් ඉටු කරන්න ඕනේ. ප්‍රේක්ෂකයන්ගේ ආදරය  දිනාගන්න පුළුවන් වෙන්නේ එතකොට. මේ ක්ෂේත්‍රයට එන ඕන කෙනෙක් මේ ක්ෂේත්‍රය ගැන හොඳ අවබෝධයකින් ඉගෙනගෙන එනවා නම් ප්‍රවීණයන්ට ගරු කරනවා නම් නිහතමානීකම තියෙනවානම් හොඳ ගමනක් යන්න පුළුවන්. මේක ලස්සන ආභරණයක් ඉතින් දිලිසෙන්න නම් නිහතමානි මේ ක්ෂේත්‍රයේ වැදගත් විදිහට ජීවත් වෙන්න ඕනේ.



**ඉදිරි වැඩ කටයුතු ගැනත් අපි පුංචි මතක් කිරීමක් කරමු.**

ඉදිරියට එන්න තියෙන අලුත් ටෙලි නාට්‍යය තමයි දෙරණ නාලිකාවේ විකාශනය වීමට නියමිත හර්ෂ උඩකන්ද මහත්මයා අධ්‍යක්ෂණය කරන භාවනා ටෙලි නාට්‍යය ඉතින් ඒක ලඟදිම බලන්න පුළුවන් වෙයි. ඒ වගේම මේනක රාජපක්ෂ මහත්මයා විසින් අධ්‍යක්ෂණය කරන අහස් ටෙලි නාට්‍යය ඒකත් ඉස්සරහට එන්න තියෙන ටෙලි නාට්‍යයක්. තව නිර්මාණයකට කතා කරලා තියෙනවා වැඩක් කරගෙන යනවා වගේම මේ දවස්වල මගේ විකාශනය වෙනවා රැල්ල වෙරළට ආදරේයි ටෙලි නාට්‍යය. ඉතින් වෙනස් කතා තේමාවකින් විකාශනය වෙන  ටෙලි නාට්‍යයක් ඒක. ඉතිං ඒකෙ ගොඩක් කටකාර අම්මා කෙනෙක්ගේ චරිතයක් තමයි නිරූපණය කරන්නේ.  ඒවා තමයි දැනට විකාශනය වෙන ඒ වගේම ඉදිරියට එන්න තියෙන නිර්මාණ ගැන විස්තර.

**Dreamy World අප සමඟ කතාබහකට එකතුවීම ගැන මොකද හිතෙන්නේ?**

ඇත්තටම මුලින්ම සුබ පැතුම්! චිත්‍රාල් ද මෙල් මහත්මයා සහ ඒ කාර්ය මණ්ඩලයට සහ ඔයාලා හැමෝටම මොකද මේ වගේ මේ කාර්යබහුලත්වයත් එක්ක අපිට පත්තරයක් කඩෙන් අරන් කියවන්න කාලයක් හම්බවෙන්නේ නැහැ. නමුත් Digital magazine එකක් තියෙනවා කියන්නේ ඕනම රැයක ඕනම තැනක හරි කමක් නෑ අපිට ඒක ඩවුන්ලෝඩ් කරලා බලන්න පුළුවන්. ඔයාලගේ පළවෙනි Magazine එක ඔයාලගේ බැලුවා ඒකෙ හරිම Creative විදිහට හරිම ලස්සනට හොඳ ආටිකල්ස් ටිකක් දැක්කා. ඉතින් මට ආස හිතුනා.

මං හදවතින්ම සුබ පැතුම් එක් කරනවා තව මේ Magazine එක දියුණුවට පත්වෙලා තව ගොඩක් කාලයක් ඉස්සරහට යන්න ලැබෙන්න කියලා. Thank you so much මේ Magazine එකේ interview එකකට මට ආරාධනා කළාට.

**මෙලනි ෆ්‍රිසන්කෝටන්**





> මොඩල් ෂූට් කරලා මං පාන්දර දෙක තුන විතර වෙද්දී ගෙදර ඇවිල්ලා පාන්දර හය වෙද්දි නිදාගන්නේ නැතුව එළිවෙනකොට ෆොටෝස් ටික දාලා ඉවරයි. එකෙන මගේ ෆොටෝස් ටික සෑහෙන්න රීච් වෙන්න ගත්තා. මාව මිනිස්සු දැනගන්න ගත්තා.

# මම උපරිමයෙන්ම උත්සාහ කලේ අද shoot එකට වඩා හෙට කරන එක හොඳට කරන්න

කසුන් ශානක බණ්ඩාර




## අපි ඔයා ගැන පුංචි හඳුන්වාදීමක් කරලම කතාබහ පටන් ගමු?

මම කසුන් ශානක බණ්ඩාර මගේ පළවෙනි ඉස්කෝලේ උනේ වත්තල ශ්‍රී රතනපාල මහ විද්‍යාලය. ඊට පස්සේ මම ඉස්කෝලේ වෙනස් කළා නවය වසරෙදි. මගේ දෙවැනි ඉස්කෝලේ වුනේ කැලණිය ගුරුකුල මහා විද්‍යාලය ඊට පස්සේ මම ඒ ලෙවල් හැදෑරුවේ මැත්ස් වලින්. ඒ ලෙවල් වලින් පස්සේ මගේ IT ඩිග්‍රී එක කරන්න මම ශ්‍රී ලංකා විවෘත විශ්ව විද්‍යාලයට ජොයින් වුණා.

ඊට පස්සේ මට 2010 වර්ෂයේදී ඇරයුමක් ලැබුණා කොළඹ තර්ස්ටන් විද්‍යාලයේ ICT විෂය භාර ගුරුතුමා විදිහට සම්බන්ධ වෙන්න. කොළඹ තර්ස්ටන් විද්‍යාලයේ ICT විෂය භාර ගුරුතුමා විදිහට අවුරුදු තුනක් වැඩ කළා. මම 2010 වසරේ ඉඳලා ප්‍රයිවට් ICT ටියුෂන් කලා. ඕලෙවල් සහ ඒ ලෙවල්. ඒ මම ඩිග්‍රිය කරන කාලේ. ඊට පස්සේ මම තර්ස්ටන් එකෙන් අයින් වුනා. මොකද මම ටියුෂන් වලට ඔලුව වැඩියෙන් වෙහෙසන්න ඕනේ. කාලය වැය කරන්න ඕන නිසා.

තර්ස්ටන් එකෙන් අයින් වෙලා සම්පූර්ණයෙන්ම මං ICT ගුරුවරයෙක් විදිහට කොළඹ, කැලණිය, ගම්පහ ටියුෂන් කළා අවුරුදු පහක් විතර. ඊට පස්සේ ඇත්තටම මම ගුරු වෘත්තියට සමුදුන්නේ 2015 දී විතර. හැබැයි මගේ hobby එක විදිහට මම පටන් ගත්තේ photography.

2011 වර්ෂයේදී කොවිඩ් වලින් පස්සේ මම එංගලන්තය ආවා. එතකොට මම එංගලන්තයේ තමයි දැන් පදිංචි වෙලා ඉන්නේ. 2021 ඉන් පස්සේ ඔහොම තමයි මගේ පාසල් කාලය සහ මේ කාලය දක්වා මගේ ලයිෆ් සයිකල් එක ගිහිල්ලා

තියෙන්නේ. මම එංගලන්තයට ඇවිල්ලා මට ඇත්තටම ආස හිතුනා music පැත්තෙන් ටිකක් ඉගෙන ගන්න. මොකද මම music art කියන දේට ගොඩක් ආස නිසා. මම දැන් ලන්ඩන් වල Hoint Blank Music  school එකේ Music production and sound engineering කියන ඩිග්‍රිය එක කරන ගමන් ඉන්නේ. මගේ ආසාවට තමයි මම ඉගෙන ගන්නේ.

**ඔයා ඡායාරූප ශිල්පියෙක්. කොහොමද මේ ඡායාරූපකරණ ක්ෂේත්‍රයට පිවිසෙන්නේ..?**

ඇත්තටම මගේ photography ජීවිතය ආරම්භ වෙන්නේ ඉතාමත් අහඹු විදිහකට. මම ඒ කාලේ වැඩ කර කර හිටියේ ගුරුවරයෙක් විදිහට. නමුත් මම photography කියන එක ඉගෙනගෙන තිබ්බෙ නෑ. මම 2011 වර්ෂය වෙනකොට DSLR කැමරාවක් අල්ලලාවත් තිබ්බේ නැහැ. මම ෆිල්ම් රෝල් කැමරාවකින් ෆොටෝස් ගහලා තිබුණා Trip යන කොට එහෙම. ඇත්තටම මට සල්ලි හම්බුනේ මගේ පළවෙනි Canon 60D කැමරාව ගන්න මගේ අප්පච්චිගේ ඉන්ෂුවරන්ස් එක කල් ඉකුත් වෙනකොට හම්බෙනවානෙ ෆන්ඩ් එකක්, ඒකෙන් හම්බවෙච්ච සල්ලි වලින් තමා. මං අප්පච්චිගෙන් ඒකට ලක්ෂ එකහමාරක් ඉල්ලගත්තා. ඒ ලක්ෂ එකහමාරයෙන් තමා මම ෆොටෝග්‍රැපි පටන් ගත්තේ. ඇත්තටම මම මේ වෙලාවේ මතක් කරන්න ඕනේ මගේ අදුරන සර් කෙනෙක් ඉන්නවා හිරෝෂ් මෙන්ඩිස් කියලා සයන්ස් ගුරුවරයෙක්. අදටත් මාත් එක්ක ළඟින් කතා කරන හිතවත් ගුරුවරයෙක්. එයාගේ Cousin කෙනෙක්ගේ හරහා තමයි මට ඕස්ට්‍රේලියාවල ඉඳන් මගේ Canon 60D කැමරා එක ගෙන්න ගත්තේ. ඒ කාලේ ගොඩක් ගණන් ඒ කැමරාව. ඉතින් ඇත්තටම එයාව මේ වෙලාවේ මතක් කරන්න ඕනේ. එතකොට මගේ පළවෙනි කැමරාව හම්බුනේ ඔය විදිහට තමයි. මම කැමරාව ගන්නකොට මට photography ගැන කිසිම අවබෝධයක් තිබ්බේ නෑ. හැබැයි ම මට තේරෙනවා මගේ ඇඟ ඇතුලේ ආට්  එකක් තිබ්බා කියන දේ. ඒ කියන්නේ ටෙක්නිකල් වයිස් නෙමේ කැමරාව කොහොමද හසුරුවන්නේ කියන එක නෙවෙයි ආට් කියන්නේ මොකක්ද ඒ කියන්නේ අපිට මොකක් හරි සීනරිස් එකක් දැක්කොත් ක ෆ්‍රේම් එකකට ගන්නෙ








කොහොමද කියලා මගේ ඔළුවේ තිබ්බා. ඉතින් ටෙක්නිකල් පාට් එක මම ගොඩක් වෙලාවට ඉගෙන ගත්තේ යූටියුබ් එකෙන් ඒවගේම මම හැගොඩ සර්ගේ අදරනියදච් එතකොට රංග දසනායක අයියගේ වෙඩින් සම්බන්ධව තිබ්බ අදරනියදච එකකට එහෙම සම්බන්ධ වුණා. ඊට පස්සේ මට මතකයි 2012 වගේ තමයි මම මුලින්ම ෆොටෝ ෂූට් කරන්න ගත්තේ මොඩල්ස්ලගේ. මොඩල් ෂූට්ස් තමයි ඇත්තටම මම වසර දොළහක් තිස්සේ මේ වෙනකම් කරේ. ඒ දවස්වල මොඩල් ෂූට් වලින් තමා මම වයදඑදටර්වයහ කියන දේ ඉගෙන ගත්තේ. ඉතින් ඒක ඇත්තටම අහඹු සිදුවීමක්. ඔය ෆේස්බුක් එකේ සෝෂල් මීඩියා වල එහෙම ශියසදබ`යදඅ එකක් තියෙනවා කියලා දැක්කොත් බොහොම අමාරුවෙන් ඕගනයිස් කරන අයට කතාකරලා මම පාස් එකක් ඉල්ලගෙන ඉතින් මම දන්නෑ කට්ටියව මට පාස් එකක් හම්බෙන්නේ බොහොම අමාරුවෙන්. හැබැයි මාව ගොඩක් හයිලයිට් උන එකම හේතුව තමයි මොඩල් ෂූට්. මං පාන්දර දෙක තුන විතර වෙද්දී ගෙදර ඇවිල්ලා පාන්දර හය වෙද්දි නිදාගන්නේ නැතුව එළිවෙනකොට ෆොටෝස් ටික දාලා ඉවරයි. එකෙන් මගේ ෆොටෝස් ටික සෑහෙන්න ඊච් වෙන්න ගත්තා. මාව මිනිස්සු දැනගන්න ගත්තා මොකද ඒගොල්ලොන්ගේ ගෙවල් වල ගිහිල්ලා ඇහැරෙනකොට ඒගොල්ලන්ගෙ ෆොටෝස් ටික ෆේස්බුක් එකේ තියෙනවා ඉතින් කසුන් ශානක වයදඑදටර්වයහ කියන බ්‍රෑන්ඩ් එක හදන්න මං මහන්සි වුනේ එහෙම. සමහර දවස් වලට ගිහිල්ලා දැන් ඉවෙන්ට් එක පටන් ගන්නේ හවස හයට නම් හතරට විතර ගිහිල්ලා තැනක් අල්ලගෙන ඉන්නවා. ඒක කොච්චර අමාරුද කියනවනම් වොෂ්රූම් එකට යන්නවත් විදිහක් නෑ මොකද අර පොඩ්ඩක් හරි හෙලවුනොත් ඒ තැනට කවුරු හරි ඇවිල්ලා අල්ලගන්නවා. ඉතින් වොෂ් රූම් එකට යන්නැතුව හොඳ තැනක් කල් අල්ලන්

මහ රෑ වෙනකං ෂූට් කරලා ගෙදර ගිහිල්ලා එළි වෙනකම් ෆොටෝස් ටික එඩිට් කරලා ඒක දාලා තමයි මම නිදාගන්නේ. ඉතින් ගොඩක් වෙලාවට මම ෂූට් එක කරලා සතියක් විතර ගිහිල්ලා ආයි බලනවා මගේ පොටෝස් වල තියන අඩුපාඩු මොනාද කියල. මොකද එදා අපි ඒ ෂූට් කරලා එදා දැම්මම අපිට ඒ පොටෝ එකේ අඩුපාඩු දැනෙන්නේ නෑ. මම උත්සාහ කරා උපරිමයෙන්ම අද ෂූට් එකට වඩා ඊළඟ දවසේ කරන ෂූට් එක මීට වඩා හොඳට කරන්න ඕන කියල. ඉතින් ඔහොම තමයි මගේ පොටෝග්‍රැපි ලයිෆ් එක පටන් ගන්නේ හොබී එකක් විදිහට මම මොඩල් පොටෝග්‍රැපි වලින් පටන් අරගෙන වෙඩින් පොටෝ ග්‍රැපි සහ කොමර්ෂල්ස් ලංකාවේ ටොප් රේටඩ් කොමර්ෂල්ස් කොම්පැනි එක්ක මම සෑහෙන්න වැඩ කළා. කැලැන්ඩර් ෂූට් කරල තියෙනවා clothing brand shoot කරලා තියෙනවා ඒ වගේම තමයි මම Wedding photography පටන් ගත්ත 2012 ඉඳලා Wedding shoots 750ක් විතර මම කරලා තියෙනවා. ලංකාවෙදි ඉතින් ඔහොම තමයි මගේ ෆොටෝග්‍රැපි ජීවිතේ ගෙවෙන්නේ.

## ඔයා කරපු photoshoots වලින් ඔයාගේ සිත්ගත්ම photoshoot එක මොකක්ද?

ඇත්තටම මට එහෙම සිත් ගත්ත මොඩල් ෂූට් එකක් හෝ photoshoot එකක් කියලා මට නම් කරන්න අමාරුයි. මොකද මේ අත් දෙකෙන්  මම photoshoot කරල ඇති මං හිතන්නේ දහදාහකට ආසන්න ප්‍රමාණයක් විතර. ඒක නිසා මම හරියටම කියන්න බෑ මේක තමයි මගේ ෆේවරිට්ම ෂූට් එක කියලා. මොකද මම එක එක විදිහට ෂූට් කරලා තියෙනවා.christmas එකට වැලන්ටයින් එකට අවුරුදු වලට කොමර්ෂල් වෙන්න පුළුවන්. මම අදටත් පරණ ෆොටෝස් බලලා ඒවා වල තියෙන අඩුපාඩු හදාගෙන ඊළඟ සූට් එක පුළුවන් උපරිමයෙන් හොඳට කරන්න තමයි මම උත්සාහ කරන්නේ.

## ඔයා දැන් ඉන්නේ UK වලනේ. එතකොට ඔයා ඒ රටේ ඉන්න විදේශිය Models ලාගේ එහෙමත් Photoshoots කරනවද?

ඇත්තටම ලංකාවට වඩා UK වල professional models ලා එක්ක වැඩ කරනකොට සෑහෙන වෙනස්. මොකද අපිට ලංකාවේ වගේ නිදහස 100% නැහැ මෙහේ මොඩල්ස්ල එක්ක වැඩ කරනකොට. මම මෙහේ පොටෝ ෂූට්ස් කලා සහ කරනවා මෙහේ මොඩල්ස්ලා එක්ක. හැබැයි මට ඒවා පබ්ලිෂ් කරන්නවත් නීතිමය අවසරයක් නෑ. මොකද මං ඒවා කරන්නේ කොම්පැනිස් වලට. ඒ කියන්නේ කොම්පැනිස් වලට කරන නිසා අපේ ඇග්‍රිමන්ට් එකේ තියෙනවා ඒ කම්පැනිස් එක්ක. මට මගේ බැක්ස්ටේජ් වත් එහෙම නැත්නම් ෆොටෝ ෂූට් වත් සෝෂල් මීඩියා දාන්නේ නෑ. ඒකට මට අවසර නෑ. හැබැයි මගේ පර්සනල් කන්ටැක්ස් වලින් මොඩල්ස්ලව සම්බන්ධ කරගෙන photoshoots කරලා social media දාලා තියෙනවා.

## අවසාන වශයෙන් මොනවද අනාගත සැලසුම්?

අනාගත සැලසුම් විදිහට කිව්වොත් මම හරි ආසයි indoor studio එකක් දාන්න ෆොටෝග්‍රැපි සම්බන්ධයෙන්. ඒ වගේම තමයි මං ඉස්සෙල්ලා කිව්වා වගේ හොබී එක විදිහට මහේ මියුසික් හදාරනවා. ඉස්සරහට ඡායාරූප ශිල්පියෙක් විදිහට වගේම අවුරුදු දොළහක් දහතුනක් ඡායාරූප ශිල්පියෙක් විදිහට දැක්කා වගේම ඉදිරියට මාව Music producer කෙනෙක් විදියටත් මේගොල්ලොන්ට දකින්න පුළුවන් වේවී. දැනටමත් මගේ සින්දුවක් රිලීස් කරලා තියෙනවා ස්ට්‍රීමින් ප්ලැට් ෆෝම් වල. ඒ කියන්නෙ Spotify වල එහෙම වගේ. එහෙම මම අලුත් මියුසික් produce කරන්න බලාපොරොත්තු වෙනවා. බලමු මේ අවුරුද්ද අවසානය වෙනකොට මම මොන වගේ දේවල් ටිකක් කරලා තියෙයිද කියලා.

**මෙලනි ෆ්‍රිසන්කෝටන්**





## කවුද මේ සාරංග නිලුක්ෂ කියලා කියන්නේ?

මම සාරංග නිලුක්ෂ. ITN නැතහොත් ස්වාධීන රූපවාහිනී සේවයේ තාක්ෂණික නිලධාරියෙකු වශයෙන් වැඩ කරනවා. 2018 තමයි මම ජොයින් වුනේ. දැන් අවුරුදු පහළොවක විතර Work Experience එකක් මට ටෙලිවිෂන් ෆීල්ඩ් එක ගැන තියෙනවා. ඊට අමතරව මට විද්‍යා උපාධිධාරියෙක් කොළඹ විශ්ව විද්‍යාලයේ Electronics and Automation Degree එකක් මට තියෙනවා. ඊට අමතරව



**Boston Lanka ඔබ වෙතට ගෙන එන Red Carpet වැඩසටහනේ අධ්‍යක්ෂකවරයත් එක්ක සොඳුරු පිළිසඳරක යෙදෙන්නට Dreamyworld අපි හිතුවා. ඉතින් අපි ඔහුගෙන්ම දැනගමු මේ Red Carpet වැඩසටහන කියන්නේ මොකක්ද කියලා.**



# ස්වාධීන රූපවාහිනි සේවයේ සජීවී වැඩසටහනකට සහභාගි වන අතරතුර තමයි එතුමාව මං මුලින් දැන හඳුනාගත්තේ

Electronics And Tele Communication ඩිප්ලෝමා එක complete කරලා තියෙනවා. ඉතින් මම කලින් නෙත් එෆ් එම් ගුවන් විදුලිය පටන් ගත්ත කාලයේ සාමාජිකයෙක්. ඒකෙ අවුරුද්දක පමණක් කාලයක් වැඩ කරලා තමයි ස්වාධීන රූපවාහිනියේ සේවයට එකතු වුණේ. අපි මේ අවුරුදු 15ක් ඇතුළත ගොඩක් වැඩසටහන් කලා. එතකොට OBT සජීවී වැඩසටහන්වලට සහභාගී වෙලා තියෙනවා.

ස්වාධීන රූපවාහිනී සේවයේ විකාශය වන Chat and Music වැඩසටහන් දෙකක් නිෂ්පාදනය කරන්න ප්‍රධාන තාක්ෂණික නිලධාරියෙකු වශයෙන් ඉතාලියට ගියා. ඒ 2018 දී. ඒ වගේම මේ ක්ෂේත්‍රයේ වැඩ කටයුතු කරනවා. දැනටත් ස්වාධීන රූපවාහිනිය සේවයේ ගොඩක් වැඩසටහන් වල තාක්ෂණික නිලධාරියෙක් විදිහට වැඩ කටයුතු කරගෙන යනවා.

**මොනවද ඉතින් මේ දවස්වල වැඩකටයුතු?**

ඇත්තටම හොඳින් වැඩ කටයුතු කරගෙන යනවා. මේ දවස්වල ස්වාධීන රූපවාහිනී සේවයේ වැඩ කටයුතු වලට අමතරව මගේ ව්‍යාපාරයක් තියෙනවා Ishara Creations කියලා. ඒ හරහා අපි Video audio solutions තමයි කරන්නේ ගොඩක්. Production

house එකක් විදියට තමයි අපි කරගෙන යන්නේ. ඒකෙ අපි ඉතාලියත් එක්ක සම්බන්ධ වෙලා එහේ සමාජ මාධ්‍ය ජාලා කිහිපයක වැඩ කරනවා. ඊට අමතරව මෙරට කුඩා වෙළඳ දැන්වීම්, සමාජ මාධ්‍ය ජාලාවලට නිකුත් කරන වෙළෙඳ දැන්වීම් වගේ වැඩ කරගෙන යනවා. ඊට අමතරව Boston Lanka ආයතනය එක්කත් වැඩ කටයුතු කරනවා.

**Boston Lanka ඉදිරිපත් කරන Red Carpet වැඩසටහන හි අධ්‍යක්ෂකවරයා වන්නේ ඔබ. ඉතින් කොහොමද එයින් ලැබෙන අත්දැකීම්?**

විශේෂයෙන් මතක් කරන්න ඕනේ චිත්‍රාල් ද මෙල් මහත්මයා ස්වාධීන රූපවාහිනී සේවයේ සජීවී වැඩසටහනකට සහභාගි වන අතරතුර තමයි එතුමාව මං මුලින් දැන අඳුනගත්තේ. එතුමාගේ ආරාධනාවෙන් තමයි. ඔහුගේ අදහසක් තිබුණා මේ වගේ වැඩසටහනක් ලංකාවේ කරන්න. නිරූපණ ශිල්පිනියන් යොදාගෙන. ඒකට තමයි මගෙත් එක්ක අදහස් හුවමාරු කරගෙන අපි එකඟතාවයකට ඇවිල්ලා අපි මේ වැඩසටහන කරන්න පටන් ගත්තේ. ඇත්තටම Red Carpet වැඩසටහනට තමයි අධ්‍යක්ෂවරයෙක් වශයෙන් මං මුල් වතාවට සහභාගී වෙන්නේ මේ වගේ වැඩසටහනක් කරන්න. ඉතින් ලොකු අභියෝග ටිකක් හම්බුනා මුලදී. ඒකට අවශ්‍ය නිරූපණ ශිල්පීන් සොයා ගැනීමේ ඉඳලා ඊට පස්සේ තාක්ෂණික පහසුකම් සපයා ගැනීමට. ඊට පස්සේ මේකට අවශ්‍ය කරන ලෝකේෂන්ස් වගේ දේවල් සපයා ගද්දී අපිට අත්දැකීම් ගොඩක් ලැබුණා.

ඒ වගේම මතක් කරන්න ඕනේ මේකට ස්වාධීන රූපවාහිනී සේවයේ ජ්‍යෙෂ්ඨ කැමරා ශිල්පී මහතෙක් තමයි මාත් එක්ක ලස්සන කෝණ වලින් මේ රූප රාමු ගන්න ගන්න වගේම photography වලට අපි එක්ක කටයුතු කරනවා. ඒ වගේම අපිත් එක්ක හොඳ වේශ නිරූපණ ශිල්පියෙක් වැඩ කරනවා. ඔහුත් කාලයක් ITN එක්ක සම්බන්ධ වෙලා දැන් විශේෂයෙන් ටෙලි නාට්‍ය ක්ෂේත්‍රයේ වැඩ කරන කෙනෙක්. ඔහුගේ සහයත් අපිට ලැබෙනවා. අපි හොඳ වැඩසටහන් කරගෙන යනවා. තව මේ වැඩසටහනේ නිවේදිකාව චලනී මේ වැඩසටහන සාර්ථක කරගෙන යන්න අපිට හොඳ සහයක් ලබා දෙනවා.

**Red Carpet වැඩසටහනෙන් වෙන්නේ මොකක්ද?**

Boston Lanka Red Carpet වැඩසටහනෙන් ඇත්තටම සිදුවෙන්නේ ලංකාවේ ඇතුළත ඉන්න ක්ෂේත්‍රයට ඒ කියන්නේ නිරූපණ ක්ෂේත්‍රයට පිවිසෙන්න ඉන්න බලාගෙන ඉන්න තරුණ පරම්පරාව විශේෂයෙන්ම නිරූපණ ශිල්පිනියන් වගේම යම්කිසි දුරකට ක්ෂේත්‍රයේ ඉස්සරහට ආපු නිරූපණ ශිල්පිනියන්ට නිවේදිකාවන්ට ඒ වගේ තරුණියන්ට තවදුරටත් මේ ක්ෂේත්‍රයේ ඉදිරියට ගමනක් යන්න පිටුවහලක් එහෙමත් නැත්නම් මංමාවත් විවර කර දීමක් විදිහට තමයි Boston



Lanka Red Carpet වැඩසටහනේ මූලික පරමාර්ථය විදිහට සිදු වෙන්නේ. අපේ චිත්‍රාල් මහත්මයාගේ Concept එකත් උනේ ඒක. මේ ක්ෂේත්‍රයේ ඉදිරියට යන්න බලාපොරොත්තු වෙන්න තරුණියන්ට අවස්ථාවක් ලබා දීම.

**මේ වෙනකොට Red Carpet වැඩසටහනේ කොටස් කියක් ප්‍රේක්ෂකයා වෙතට සමීප කරලා තියෙනවද?**

ඇත්තටම Boston Lanka Red Carpet වැඩසටහනේ කොටස් අටක් මේ වෙනකොට අපි නිෂ්පාදනය කරලා අවසන් කරලා තියෙනවා. මේ වෙනකොට වැඩසටහන් පහක් පමණ ප්‍රේක්ෂකයාට දැක ගන්න ලැබෙනවා බොස්ටන් ලංකා මාධ්‍ය ජාලය හරහා. ඇත්තටම එහෙම තමයි මේ වෙනකොට අපි ඊළඟ schedule එකටත් ලෑස්ති වෙමින් ඉන්නේ මේ දවස්වල. ඊළඟ වැඩසටහන් හතර නිෂ්පාදනය කරන්න අවශ්‍ය පසුබිම සකසා ගනිමින් පවතිනවා මේ වෙනකොට.

**Red Carpet වැඩසටහනෙන් ඉදිරියේ දී නවමු අත්දැකිමක් ප්‍රේක්ශකයාට සමීප කරයිද?**

ඔහු ඇත්තටම අපි බලාපොරොත්තු වෙනවා Red Carpet වැඩසටහන ඉස්සරහට තවත් අලුත් මුහුණුවරයකින් අවම වූ විශේෂ දේවල් එකතු කරන්න විශේෂයෙන් ශ්‍රී ලංකාවේ සුන්දර ස්ථාන ඒ වගේම විවිධ සේවා සපයන කට්ටියත් එකතු කරගෙන ඒගොල්ලන්ගේ දැනුම ඒගොල්ලන්ගේ හැකියාවන් මේකට එකතු කරලා ඒගොල්ලන්ටත් ක්ෂේත්‍රයේ තවත් තවත් ජනප්‍රිය වෙන්න පිළිගැනීමක් ඇති කරන්න. ඉදිරියේ අපි බලාපොරොත්තු වෙනවා අවස්ථාවක් ලබා දෙන්න. ඒ වගේම අපි  නිරූපණ ක්ෂේත්‍රයේ, නිවේදන ක්ෂේත්‍රයේ, අය වගේම  නළු නිළියන් වගේ ක්ෂේත්‍රයේ දැනට ජනප්‍රිය ශිල්පීනුත් වැඩසටහනට සහභාගී කරගන්න ඉදිරියේදී බලාපොරොත්තු වෙනවා.

**කොහොමද ඉතින් ඔයාගේ මේ හැම වැඩකදීම පවුලෙන් ලැබෙන ඒ සහය?**

මගේ බිරිඳත් රාජ්‍ය සේවයේ නිරත වෙන නිලධාරිනියක්. ඉතින් මමත් දරුවන් දෙදෙනෙකුගේ පියෙක්.








ඇත්තටම ඇයගේ තියෙන කාර්යබහුලත්වයත් එක්ක මගේ වැඩ කටයුතු වලට ගොඩක් සමීප වෙන්න බැරි වුනත් පවුලෙන් මට අවශ්‍ය සහයෝගය අනිවාර්යෙන්ම මට ලබා දෙනවා. මොකද මට දරුවොත් එක්ක රැඳෙන්න තියෙන කාලය ටිකක් අඩු නිසා.

ඒ පැත්තෙන් දරුවන්ට වෙන අඩුපාඩුව සම්පූර්ණ කරගනිමින් මගේ ගමනට ලොකු පිට වහලක් ලබා දෙනවා ඇය අංජලී සමරවීර. වෘත්තීයෙන් ග්‍රාම නිලධාරීවරියක් වශයෙන් කටයුතු කරනවා. අපි විවාහ වෙලා මේ වෙනකොට අවුරුදු දොළහක් වෙනවා.

**ඉතින් එහෙම තමයි Red Carpet වැඩසටහන වෙන්නේ ඒ වගේම ඒ වැඩසටහනේ අධ්‍යක්ෂකවරයාගේ විස්තර. ඉතින් විවිධ ක්ෂේත්‍රයන්හි දස්කම් පෙන්වන අයගේ ඒ දැනුම Red Carpet වැඩසටහනින් ඔබ වෙතට ගෙන එන්න අපි සුදානම්. ඉතින් රැඳී සිටින්න Boston Lanka මාධ්‍ය ජාලය සමඟ.**

**මෙලනි ෆ්‍රිසන්කෝටන්**



# නිරූපණ ක්ෂේත්‍රයේ දිගු ගමනක් ගිය ඇය එක්ක තමා මේ පුංචි කතාබහ

ශානි විද්නිකා

**අපි ඔයා ගැන හඳුන්වාදීමක් කරලම කතාබහ ආරම්භ කරමු නේද?**

හායි, මම ශානි විද්නිකා. මම මූලික අධ්‍යාපනය ගාල්ල ශ්‍රී හෘදය කන්‍යාරාමයෙන් ලැබීමෙන් අනතුරුව ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලයෙන් විද්‍යාවේදී උපාධිය ලබා ගැනීමට සමත් වුණා. දැනට මම විද්‍යා සහ තාක්ෂණවේද ක්ෂේත්‍රයේ රැකියාවක නියුතු වෙනවා.



**ඔයා නිරූපණ ක්ෂේත්‍රයට ඇවිත් කොච්චර කාලයක් වෙනවද?**


මම නිරූපණ ක්ෂේත්‍රයට පිවිස දැනට අවුරුදු පහකට Brien Kerkovan Academy එකෙන් නිරූපණ ක්ෂේත්‍රය පිළිබඳ මූලික හැදෑරීමක් සිදුකර මේ දක්වා නිරූපණ ක්ෂේත්‍රයේ වැඩ කටයුතු කරගෙන ඉන්නවා.

**නිරූපණ ක්ෂේත්‍රය ගැන ඔයාගේ අදහස?**

ඇත්තටම හොඳ ක්ෂේත්‍රයක්. නිරූපණ ක්ෂේත්‍රය, කලාව අරමුණු කරගෙන මෙන්ම වාණිජ පරමාර්ථයන් අරමුණු කරගෙනද බිහිවුණු ක්ෂේත්‍රයක්. එයින් වර්තමානය වන විට වාණිජ පරමාර්ථයන් ඔස්සේ නිරූපණ ක්ෂේත්‍රයේ විවිධ මං පෙත් විශාල වශයෙන් විවර වෙලා තියෙනවා.

එම නිසා නිරූපණ ක්ෂේත්‍රය, කලාව හා විලාසිතා ක්ෂේත්‍රයටත් වඩා විවිධ මුහුණුවරවලින් යුතුව වර්තමාන ලෝකය තුළ marketing strategic tool එකක් ලෙස හා පිළිගත් වෘත්තියක් ලෙස අද තිබෙන තැන ගැන ඉතාම සතුටුයි.

එහිදී අදාළ විෂයය පිළිබඳ නිසි හැදෑරීමක් ඔස්සේ එම ක්ෂේත්‍රයට පිවිසීම තුළින්, ක්ෂේත්‍රයට සාධාරණයක් මෙන්ම එහි ජීවගුණය පවත්වා



ගැනීමටත් නිරූපණ ශිල්පිනියක් වශයෙන් සාර්ථක වීමටත් එය අත්‍යාවශ්‍යයි කියන එක මම තරයේ විශ්වාස කරන කාරණාවක්

**ඔයා දැනට shoots කියක් විතර කරලා තියෙනවද?**

දැනට මම ක්ෂේත්‍රයේ වැඩ පටන් ගත් දා සිට Glamour shoots, Art and Conceptual shoots, Brand shoots (Clothing and Product), Bridal shoots, Promotional shoots ඇතුළුව shoots 100කට වඩා වැඩි සංඛ්‍යාවකට නිරූපණ දායකත්වය ලබා දීලා තියෙනවා.

ඊට අමතරව Fashion show ramping, TV commercials සඳහා ද මාගේ දායකත්වය ලබා දී තිබෙනවා.

**ඔයා ගොඩාක්ම කැමති මොනවගේ shoots කරන්නද?**

වාණිජ සහ කලාත්මක ක්ෂේත්‍රයන් ඔස්සේ නිරූපණ වැඩ කටයුතුවල නියැලීමට වැඩි කැමැත්තක් දක්වනවා.





**මෙලනි ග්‍රිසන්කෝටන්**

Photography:
Kasun shanaka



# ක්ෂේත්‍රයේ කැපී පෙනෙන දක්ෂ නිවේදිකාවක් වීම තමයි මගේ බලාපොරොත්තුව

චලනි ප්‍රනාන්දු




### ඔයා ගැන පුංචි හඳුන්වාදීමක් කරලම ඉමු?

මගේ නම චලනි ප්‍රනාන්දු. මම ප්‍රධාන වශයෙන් සංචාරක කර්මාන්තයට වගේම විකුණුම් සහ අලෙවිකරණයට සම්බන්ධ වෙලා ඉන්නවා. විවිධ මෝස්තර නිර්මාණකරුවන් සහ ඡායාරූප ශිල්පීන් සමඟ අලුත් විදිහේ නිර්මාණ කිරීමට බලාපොරොත්තු වෙනවා. විශේෂයෙන් මම නිරූපිකාවක් සහ නිවේදිකාවක් වශයෙන් කටයුතු කරනවා වගේම මම ඒ දේට ගොඩාක් කැමතියි.

### Presenting වලට අමතරව තව ඔයා මොනවද කරන්නේ?

Presenting වැඩ වලට අමතරව දැනට මගේ වැඩිදුර අධ්‍යාපන කටයුතු වල වැඩ කරගෙන යනවා.

### ගොඩාක්ම කැමති Fashion Modeling වලටද නැත්නම් Presenting වලටද?

ගොඩාක්ම කැමති Presenting වලට.

### චලනිගේ අනාගත බලාපොරොත්තු මොනවද?

Marketing related promotions, Boston Lanka Media Network එකට සම්බන්ධ වැඩ වලට ඉදිරියේදිත් දායක වෙන්න බලාපොරොත්තුවෙන් ඉන්නවා.

**මෙලනි ෆ්‍රිසන්කෝටන්**


nka
et
මගින්
න ඇය
ුංචි
ක්
ුවා



# මම පොඩි කාලේ ඉඳන් සිනමාවට මාර විදිහට ආදරය කරනවා

## මධුෂානි වික්‍රමසිංහ

**රිදී තිරයට පැයු ලස්සන තාරකාවක් එක්ක තමයි Dreamy World අපි අද සුන්දර කතාබහක නිරත වෙන්න හිතුවේ**



**ඉතින් කොහොමද ජීවිතේ?**

හොඳයි ගොඩක් හොඳින් ඉන්නවා. 2024 අලුත් වැඩ ගොඩක් එක්ක ඔන්න පටන් අරන් තියෙනවා. මං හිතනවා 2023 ත් මට හරි ලකී අවුරුද්දක් වුණා. 2024 ත් ඒ වගේම වෙයි කියලා මම බලාපොරොත්තු වෙනවා.

**මධුෂානි කොහොමද මේ කලා ක්ෂේත්‍රයට එන්නේ?**

මම එන්නේ 2018 වර්ෂයේදී. 2017දී ජාතික තරුණ සේවා සභාවේ රංගන පාසලෙන් පූර්ණ කාලීන රංගන පාඨමාලාව හදාරලා තමයි මම රංගනයට එන්නේ.

**වැඩියෙන්ම ආස කරන්නේ රිදී තිරයටද?**

ඇත්තටම මං ආස රිදී තිරයට. මං පුංචි කාලේ මට හීනයක් තිබුණා සිනමා නිළියක් වෙන්න ඕන කියලා. රිදී තිරයට තමයි මම ගොඩක් ආදරය කලේ. ඒකට හේතුව මගේ අම්මා. එයා හොඳ ෆිල්ම් ෆෑන් කෙනෙක්. එයා පොඩි කාලේ මං හම්බෙන්න ඉන්න කාලේත් චිත්‍රපටි නරඹනවා. චිත්‍රපටි ගීත අහනවා. මං පොඩි කාලෙත් මට නිතරම චිත්‍රපටි සිංදු ඇහෙනවා. ඒ වගේ පරිසරයක තමයි මම හිටියේ. එතකොට මම පොඩි කාලේ ඉඳන් සිනමාවට මාර විදිහට ආදරය කරනවා. එතකොට මට ගොඩක් රංගන අවස්ථා එහෙම ලැබෙන්නෙත් සිනමාවෙන්. එතකොට සිනමා ක්ෂේත්‍රයේ තමා වැඩි කාලයක් මං ගත කරන්නේ මගේ රංගන දිවියේ. එහෙම තමයි.

**ඔයා වඩාත්ම ප්‍රිය කරන ඔයා රඟපාපු චරිතය මොකක්ද?**

වැඩිපුරම මම කැමති "ආදරේයි ජානු" කියලා මං චිත්‍රපටියක් කරලා තියෙනවා. ඒක upcoming movie එකක්. දැනට Release වෙලා නෑ. මේ අවුරුද්දේ Release වෙයි බොහෝ දුරට.

## මට දැනට ලැබෙන්නේ ඒ වගේම ගොඩාක් නිර්මාණ වලට කතා කරන්නේ පෙම්වතියගේ චරිතයට

ඒකේ "ජානු" සහ "නාමලී " කියලා චරිත දෙකක් නිරූපණය කරන්න තිබුණා. ඒ කියන්නේ ඩබල් ඇක්ටින්.

Actor කෙනෙක්ට හරි Actress කෙනෙක්ට හරි ඒ වගේ අවස්ථාවක් ලැබෙන්නේ හරිම කලාතුරකින්. මං ඒ චරිත දෙකම කලේ හරිම ආසාවෙන්. වෙනස් විදිහට. ඉතින් මම "ආදරේයි ජානු" කියන චිත්‍රපටියේ ඒ චරිත දෙකට තමයි වැඩිපුරම කැමති.

**මං කවදාකහරි මේ වගේ චරිතයක් කරනවා කියලා ඔයාගේ හිතේ තියෙනවද?**

මම කවදාකහරි කරන්න ආසයි කියලා හිතෙන චරිත කිහිපයක් තියෙනවා. හැබැයි මට දැනට ලැබෙන්නේ ඒ වගේම ගොඩාක් නිර්මාණ වලට කතා කරන්නේ පෙම්වතියගේ චරිතයට. මොකද මගේ පෙනුමයි වයසයි එක්ක. නමුත් ඉදිරියේදී මං බලාපොරොත්තු වෙනවා වගේම ආසාවෙන් ඉන්නවා මෙහෙණින් වහන්සේ කෙනෙක්ගේ චරිතයක් කරන්න. මං හිතනවා කවදාකහරි ඒ වගේ චරිතයකට මට කතාකරයි කියලා. නමුත් දැනට මට හම්බවෙන්නේ පෙම්වතියගේ චරිත. ඒවත් එකිනෙකට වෙනස් ආකාරයෙන් මං try කරනවා. හිතේ තියෙන හීනේ චරිත මොන වගේ වුණත් ඒකට උපරිම සාධාරණයක් ඉටුකරන එක. මොකද පිටපත් එකින් එකට වෙනස්. චරිත එකින් එකට වෙනස්. ඒ වෙනස් භාවය තියාගෙන ප්‍රේක්ෂකයාට ඒකාකාරී නොවන විදිහට මගේ චරිතය නිරූපණය කරන එක තමා මං ආසම දේ.

**ආදරය සහ ජීවිතය ගැන ඔයාගේ දැක්ම මොනවගේද?**

ආදරය සහ ජීවිතය ගැන කතා කළොත් ජීවිතය කියන්නේ හරිම කර්කශ කටුක හරි අමාරු දෙයක් නෙවෙයි. ඇත්තටම ජීවිතේ කියන්නේ හරි සරල දෙයක්. මිනිස්සුන්ට තියෙන දේවල් සහ මිනිස්සු ගොඩනගා ගන්න දේවල් එක්ක තමයි ඒක සංකීර්ණ වෙන්නේ. මිනිසුන්ගේ සම්බන්ධතා අනුව තමයි ඒවා සංකීර්ණ වෙන්නේ. හැබැයි ජීවිතය කියන්නේ හරිම සරල දෙයක් වගේ තමයි මට දැනෙන්නේ. ඇත්තටම මගේ ජීවිතේ නම් මං හරි සැහැල්ලුවෙන් ගත කරන්නේ. මං හරිම සරල කෙනෙක්. ආදරේ කියලා ගත්තට පස්සේ මං ආදරේ විඳින්නේ මගේ දෙමාපියන්ගෙන්. ඒ කියන්නේ මගේ අම්මා තාත්තගෙන්. සුරතල් සත්තු එක්ක තමයි ආදරේ විඳින්නේ පෙම්වතෙක් හෝ වෙන පාර්ශ්වයකින් යාළුවන්ගෙන් මං හිතන්නේ නෑ එහෙම අවංක පිවිතුරු ආදරයක් ලැබෙනවා ඇති කියලා. කොයි වෙලාවකවත් එහෙම විශ්වාස කරන්න පුළුවන්




මට්ටමක දේවල් මගේ ජීවිතේ අත්දැකීම් නැහැ.


ඒක නිසා මම විශ්වාස කරන්නේ දෙමව්පියන්ගේ ආදරය සහ සුරතල් සතුන්ගේ ආදරය විතරයි පිවිතුරු ආදරේ විදියට දකින්නේ. ජීවිතය ගැන මට කියන්න පුළුවන් දේ තමයි හරිම සරලයි මිනිස්සු විසින් තමයි ඒක සංකීර්ණ කරගෙන තියෙන්නේ.

**වර්තමාන ලාංකිය සිනමා ක්ෂේත්‍රය ගැන මොකද හිතෙන්නේ?**

වර්තමාන සිනමා ක්ෂේත්‍රය ගැන කතා කරද්දි දැන් ගිය අවුරුද්දයි මේ අවුරුද්දයි බලනකොට 2023 අවුරුද්දෙත් 2024 අවුරුද්දේ මුලත් සිනමාවට හරි හොඳ කාලයක් කියලා මට හිතෙනවා මොකද නිර්මාණ කිහිපයක් එකවර රිලීස් වුණා. ඒ වගේම ඒ හැම නිර්මාණයක්ම දිවයින පුරා වගේම ලෝකෙ වටෙත් තිරගත වුණා. ඒවට ලොකු ප්‍රේක්ෂක ප්‍රතිචාරයක් සහ සිනමා කර්මාන්තයේ නිෂ්පාදකවරුන්ට හොඳ ආදායමක් ලැබුණා.

නිර්මාණ හරහා ඉතින් මම හිතන්නේ







සිනමා ක්ෂේත්‍රය තුළ කලින් කඩා වැටිලා මේකට පිළියම් රජය විසින් දෙන්න ඕනේ. රජය වග කියන්න ඕනි. ඒ වගේ දේවල් වලට වැඩිය මං හිතන්නේ අපි කරන ෆිල්ම් එක ඇතුලේ තියෙන අන්තර්ගතය පවර්ෆුල් වෙන තරමට තමයි ප්‍රේක්ෂකයාට  මේ නිර්මාණය රස විඳින්න පුළුවන් වෙන්නේ. ප්‍රේක්ෂකයා කටින් කට ගිහින් මේ සිනමා නිර්මාණය හොඳයි. ඔයාලත් ගිහින් බලන්න කියන මට්ටමට සිනමා කෘතියක් හදන්න පුළුවන්නම් සිනමා ක්ෂේත්‍රයේ කඩා වැටීමක් ඇතිවෙන්නේ නෑ කොයි වෙලාවකවත්.  කඩා වැටෙන්නේ නෑ ප්‍රඩක්ට් එකේ කොලිටි එක බාල නම්. මට මතකයි කාලයක් මිනිස්සු සිංහල

**මට තාම ඇහුනේ නෑ සිංහල ෆිල්ම්ස් හොඳ නෑ කියනවා. මොකද පහුගිය අවුරුද්දේ රිලීස් වෙච්ච කතුරු මිතුරු මං හිතන්නේ දින එකසිය ගාණක් දුවනවා**

ෆිල්ම්ස් බලන්නේ නැහැ. අපේ සිංහල ෆිල්ම් නම් වැඩක් නැහැ. Netflix එකේ එහෙමනම් හොඳ ෆිල්ම්ස් තියෙනවා. වෙන ඔය වෙබ්සයිට් වල එහෙම තියෙනවා හොඳ ෆිල්ම්ස්.

ෆිල්ම් එකක් බලනවනම් English film එකක් තමයි හින්දි ෆිල්ම් එකක් නැත්නම් ඉන්දියන් ෆිල්ම් එකක් තමයි බලන්න ඕනේ කියලා මිනිස්සු කියන කාලයක් තිබුණා. හැබැයි ගිය අවුරුද්දෙත් මේ අවුරුද්දෙත් මට තාම ඇහුනේ නෑ සිංහල ෆිල්ම්ස් හොඳ නෑ කියනවා. මොකද පහුගිය අවුරුද්දේ රිලීස් වෙච්ච කතුරු මිතුරු මං හිතන්නේ දින එකසිය ගාණක් දුවනවා. මේ දක්වාත් තාම තිරගත වෙනවා. ඉතින් හොඳ නිර්මාණ ප්‍රේක්ෂකයාට සමීප දේවල් ලංකාවේ නිර්මාණය කරන්න ඒවත් එක්ක තමයි මිනිස්සු බලනවද නැද්ද කියලා තීරණය වෙන්නේ. සමාජමාධ්‍ය ජාල මඟින් ප්‍රතිචාර දක්වමින් ෆිල්ම් එකට ෆිල්ම් එකෙන් කරන කැම්පේන් එකට අමතරව ප්‍රේක්ෂකයගෙන් ලැබෙන ප්‍රතිචාර ගොඩක් වටිනවා. ඒකෙන් තමයි ෆිල්ම් එකක් දුවන්න පුළුවන් වෙන්නේ. ඉතින් පහුගිය කාලේ වගේම මේ අවුරුද්දෙත් ඉදිරියට එහෙම වෙයි කියලා මං හිතනවා.



අනාගතයටත් මේ දක්වාත් මං හිතනවා පහුගිය කාලේ තිබ්බ ඒ ඛේදවාචකය ඇති වෙයි කියලා. මොකද සිනමාවේ වසන්ත කාලය ආවා කියල මම හිතනවා. හොඳ නිර්මාණ කීපයක් ඒත් එක්කම එක දිගට තිරගත වෙනවා. ඉතින් මම හිතනවා මේක සිනමාවට හොඳ කාලයක් කියලා.

**විවිධ ආකාරයේ Photo shoots කරන්නත් මධුෂානි ගොඩාක් කැමතියි වගේ?**

ඔව්.. මම රංගන ශිල්පිනියක් විදිහට අමතරව නිරූපණ ශිල්පිනියක් විදිහටත් කටයුතු කරනවා. ඉතින් මට කන්සෙප්ෂුට්ස් ගොඩකට කතා කරනවා. නිරූපණය කරන්න. ඒකත් එක්ක මම හරි ඒ කියන්නේ මම ෆොටෝ ෂූට් එකක් ආවට පස්සේ බලන් ඉන්නේ ඒක රිලීස් වෙන්නේ කවදද කියල. මොකද රිලීස් උනාට පස්සේ සතියක් විතර සමාජ මාධ්‍ය ජාලාවල මගේ ෂූට් එක viral වෙනවා. ඒක මං දන්නෑ ඒක Photographers ගේ ටැලන්ට් එක සහ concepts හරි පවර්ෆුල් මම කරන. ඒ නිසා වෙන්න ඇති. ඒ නිර්මාණ ගොඩක් වයිරල් වෙනවා. ඉතින් සතුටුයි මට photoshoots විවිධ conceptsවලින් කරන්න ලැබීම ගැන.

**ඉදිරියේදි ඔයාගේ එන්න තියෙන අලුත් නිර්මාණ වගේම කරන්න ඉන්න වැඩකටයුතු ගැනත් මතක් කරමු.**

ඉදිරියේදී එන්න තියෙන නිර්මාණ ගැන කතා කරද්දි ෆිල්ම්ස් හතරක් මගේ රිලිස් වෙන්න තියෙනවා. මං හිතන්නේ ඒකෙන් දෙකක් විතර මේ අවුරුද්දේ රිලීස් වෙයි. ඒ වගේම කතා කරල තියෙනව

# මොකද රිලීස් උනාට පස්සේ සතියක් විතර සමාජ මාධ්‍ය ජාලවල මගේ ෂූට් එක viral වෙනවා



අලුත් දකුණු ඉන්දියානු සිනමා නිර්මාණයකට. ඒකෙ ප්‍රධාන චරිතයට. ඉතින් මම ඒකටත් ගොඩක් සතුටුයි සහ ඒකෙ වැඩ කරන්න ගොඩක් ආසාවෙන් බලන් ඉන්නවා. මොකද පළවෙනි වතාවට තමයි මට දකුණු ඉන්දිය නිර්මාණයකට රංගනයෙන් දායක වෙන්න කතා කරන්නේ. ඉතින් ඒක සතුටක්. ඊට අමතරව මේ වෙද්දි අප්‍රේල් මාසයේ රූගත කිරීමට නියමිත දැවැන්ත සිනමා නිර්මාණයක් එක්ක වැඩකටයුතු පටන් අරගෙන තියෙනවා. ඒවායි පොටෝ ෂූට්ස් සහ මගේ පෞද්ගලික ව්‍යාපාරයක් තියෙනවා. Clothing brand එකක්. මගේ ව්‍යාපාර කටයුතුයි රංගන කටයුතුයි සමබරව කරගෙන යනවා.

**Dreamy World අප සමඟ කතාබහකට එකතුවීම ගැන ඔයාගේ අදහස කියලම අපි කතාබහ අවසන් කරමු.**

ඇත්තටම සතුටුයි. මාත් එක්ක මේ interview එක කළාට Thank you, Dreamy World සහ ඔිගොල්ලන්ගේ Magazine එකට මම සුබ පතනවා. අලුත් නිර්මාණ සහ අලුත් රංගන ශිල්පීන්ගේ විස්තර දිගින් දිගටම අප්ඩේට් කරගෙන යන්න කියලා. ජය වේවා!

**මෙලනි ෆ්‍රිසන්කෝටන්**



# ඇය නිරූපණ ක්ෂේත්‍රය තමන්ගේ විනෝදාංශය කරගත් යුවතියක්

රන්දී දුලංජලා



**අපි ඔයා ගැන හඳුන්වාදීමක් කරලම කතාබහ ආරම්භ කරමු නේද?**


මගේ නම රන්දි මම ඉන්නේ UK වල. මම මගේ මාස්ටර් ඩිග්‍රි කරන්න තමයි UK වලට ආවේ දැන් අවුරුද්දකට කලින්.

**ඔයා නිරූපණ ක්ෂේත්‍රයට ඇවිත් කොච්චර කාලයක් වෙනවද?**

නිරූපණ ක්ෂේත්‍රයට ඇවිත් මම දැන් අවුරුදු පහක් හයක් වෙනවා. සමහර මොඩ්ලින් ෂූට් වලට ගිහින් එහෙම තියනවා හැබැයි ලොකුවට මොඩ්ලින් මම කරේ නැහැ. බ්‍රයිඩල් ෂූට්ස් සහ වෙනත් Photo shoots වගේ දේවල් තමා කරලා තියෙන්නේ.

**නිරූපණ ක්ෂේත්‍රය ගැන ඔයාගේ අදහස?**

ඇත්තටම කිව්වොත් නිරූපණ ක්ෂේත්‍රය ගැන මම හරිම කැමතියි ඒකට. මොකද ඒක හරියට හැමවෙලේම වෙනස් වෙන දෙයක් ෆැශන් කරනවා කියන එක. ඉතින් මම ගොඩක් Interesting fashion වලට ඒ වගේම මොඩලින් කියන්නේ හරිම හොඳ දෙයක් ආස හිතෙන දෙයක්. මොකද කාලෙන් කාලෙට එනම් Trending fashions වගේ ඒවා introduce කරලා දෙන්නේ මොඩල්ස්ලා. ඉතින් මම හිතනවා ඒක හොඳ දෙයක් අනිත් එක හරිම ක්‍රියේටිව් දෙයක්. ඉතින් මං හරිම කැමති



ෆීල්ඩ් එකක් Modeling කියලා කියන්නේ.

**ඔයා දැනට Photo shoots කියක් විතර කරලා තියෙනවද?**

මම කරලා තියෙනවා Photo shoots කිහිපයක්ම නමුත් මෙහාට ආවට පස්සේ නම් මම කරල තියෙන්නේ ෂූට්ස් තුනක් වගේ ලංකාවේ දී මං බ්‍රයිඩල් ෂූට්ස් දෙකක් කරලා තියෙනවා. ඊට පස්සේ කැශුවල් ෂූට්ස් තුනක් වගේ කරලා ඇති. ඒ කියන්නේ මම ෆුල් ටයිම් මොඩ්ලර් කෙනෙක් නෙවෙයි. Studies කරන ගමන් සහ Work කරන ගමන් තමයි ඒක කරන්නේ හොබී එකක් විදියට වගේ.

**ඔයා ගොඩාක්ම කැමති මොනවගේ Shoots කරන්නද?**

මම කැමතිම ෂූට්ස් තමයි මම කැෂුවල් ෂූට්ස් වලට කැමති. ඒක මොකක් හරි කොන්සෙප්ට් එකකට වෙනවනම් ගොඩක් කැමතියි. ඒ වගේම තමයි ම බ්‍රයිඩල් ෂූට්ස් වලටත් ගොඩක් කැමතියි.

**මෙලනි ෆ්‍රිසන්කෝටන්**

Photography:
Kasun shanaka

# ලාංකීය සිනමාවේ අධ්‍යක්ෂකවරියන් ඇත්තටම අපි ඇඟිලි ගානට ගාණක් තමයි ඉන්නේ

## වින්ද්‍යා හාරිස්පත්තුව



**ලාංකිය සිනමාවට අධ්‍යක්ෂකවරියක් කියන්නේ වටිනා සම්පතක්. ඇය අධ්‍යක්ෂණයෙන් හැඩ කරන සෑම නිර්මාණයක්ම ඇගේම තිර පිටපත් රචනා වීම විශේෂත්වයක්. ඇය නමින් වින්ද්‍යා හාරිස්පත්තුව.**

**ආයුබෝවන් වින්ද්‍යා හාරිස්පත්තුව කොහොමද ඉතින්?**

ආයුබෝවන් මෙලනි! ඉතාමත් හොඳින් කාලය ගත කරනවා සහ ටිකක් කාර්යබහුලයි මේ දවස්වල. ඉතාමත් නුදුරු අනාගතයේදී රූපගත කිරීමට නියමිත අලුත් චිත්‍රපටියක් ඒකෙ පිටපතට මේ දවස් වල සෑහෙන්න මහන්සි වෙනවා කිව්වොත් හරි. පිටපත එක්කම. මොකද ඒකට ලංකාවේ අතීතයේ වර්තමානයේ අනාගතය කියන කාල තුළ ලංකාවේ සමාජය තුළ බලපාන ප්‍රධානතම ප්‍රශ්නයක් තමයි මේ චිත්‍රපටිය තුළ අපි කතා කරන්නේ. එතකොට ඒකට Details ගන්න අපිට මේ දවස් වල ඉතින් පොලිසිය හා සම්බන්ධ වෙලා වැඩ කරනවා. එහෙට මෙහෙට යනවා. ඒක නිසා චුට්ටක් විතර කාර්යබහුලයි ඒ ගේම ඒ චිත්‍රපටිය ජාත්‍යන්තර මට්ටමේ සිනමාව උළෙලවලටත් සහභාගි වෙන්නට නියමිත නිසා මේ දවස්වල ඉතා කාර්යබහුල විදිහට චිත්‍රපටියත් එක්කම කාලය ගත වෙනවා.

**2023 දෙසැම්බර් 26 වන දින Dreamy World New York Creations හි මිලඟ දැවැන්ත නිර්මාණයට ආධුනික රංගන ශිල්පින් ශිල්පිනියන් තෝරාගැනිමේ තිර පරික්ෂණයක් පැවැත්වුණා. ඒ ගැනත් කියමු?**

ඔව් අපි 26 වැනිදා Audition එක තිබුණා. ඇත්තටම  Dreamy World New York Creations ආයතනය කියන්නේ ලංකාවට ආව සෑහෙන වටිනා අවස්ථාවක්. අපේ රටේ ජනතාවට අපේ රටේ ළමයින්ට ජාත්‍යන්තර සිනමාකරණයට පිවිසෙන්න තියෙන ප්‍රධාන දොරටුවක් කියලා කිව්වොත් හරි Dreamy World New York Creations ආයතනය. ඉතින් අපේ Audition එක අපි සාර්ථකව පැවැත්වුවා. ඔව්.. බලාපොරොත්තු වෙනවා දැවැන්ත නිර්මාණ දෙකේ

වැඩකටයුතු ඉතාමත් ඉක්මනින් පටන් ගන්න. ඒ වගේම මේ ආයතනය එක්ක සම්බන්ධ වෙලා වැඩ කරන් ළමයින්ටත් සුබ පතන්න මං මේක අවස්ථාවක් කරගන්නවා.

**ලාංකිය සිනමාවට අධ්‍යක්ෂකවරියන් ගොඩාක් අඩුයි. ඔබට හිතෙන විදිහට ඊට හේතුව මොකක් වෙන්න ඇතිද?**

ඔව් ලාංකීය සිනමාවේ අධ්‍යක්ෂකවරියන් ඇත්තටම අපි ඇඟිලි ගානට ගානක් තමයි ඉන්නේ. මේකයි අධ්‍යක්ෂකධූරය කියන්නේ කාන්තාවන්ට ලංකීය සංස්කෘතිය බැලුවම ටිකක් විදිහේ බරපතල කරුණක්. කාන්තාවකට සාමාන්‍යයෙන් හවස හයෙන් පස්සේ එළියට බහින්න බෑ. ඒ වගේ මතිමතාන්තර එක්ක ආව හරි ආදරණීය සංස්කෘතියක් තියෙන රටක් මේක.

ඉතින් මේ සංස්කෘතිය ඇතුලේ මේ අධ්‍යක්ෂකවරියක් කියන ඒ භූමිකාව ඇතුලේ අපිට උදයක් දවාලක් නෑ. වැස්සක් අව්වක් නෑ. අව්වේ කරවෙන්න තියෙනවා ගෑනු ළමයි චුට්ටක් අකමැතියිනේ අව්වේ කර වෙන්න. ඒ වගේ තමයි අපිට රැයක් කියල දෙයක් නෑ. සමහර දවස්වලට දවල් දෙකට ෂූටින් පටන් ගත්තම පහුවදා උදේ හත හෝ අට වෙනකන් shooting කරනවා. එතකොට ඔය කාරණා එක්ක අධ්‍යක්ෂකවරියක් කියන කෙනාට ලොකු confidence එකක් තියෙන්න ඕනේ. මිනිස්සු නොමිනිස්සු කියලා බෙදන්න බෑ. මොකද හැම කෙනා එක්කම ආශ්‍රය කරන්න ඕනි.

අධ්‍යක්ෂකවරියක් කියන කාරණය පිරිමියෙක්ට වඩා




කාන්තාවකට අපේ සංස්කෘතිය එක්ක මම කතා කරන්නේ ඇත්තටම අමාරු දෙයක්. අධ්‍යක්ෂකවරෙයෙක් වෙනවට වඩා අමාරුයි ෆීල්ඩ් එකේ අධ්‍යක්ෂකවරියක් වශයෙන් රැඳිලා ඉන්න එක. අන්න ඒ කාරණාවත් එක්ක සහ කාන්තාවක් කිව්වම ගේක දොරක සෑහෙන්න වගකීමක් තියෙනවා උයන්න පිහන්න. එතකොට ඒ දේවල් එක්ක අධ්‍යක්ෂකවරියක් කියන එකත් එක්ක අපිට ගොඩක් කැප කිරීම් කරන්න සිද්ධ වෙනවා සමහර වෙලාවට. එතකොට කාන්තාවකට සමහර වෙලාවකට මේක අමාරුයි. මේක අභියෝගයක්. ඉතින් ආරක්ෂාව කියන දේ එතකොට සමාජයත් එක්ක ගැටෙනවා කියන දේ එතකොට තමන්ගේ වගකීම් නිවස තුළින් බැහැර වෙනවා කියන කාරණාත් එක්ක තමයි මං දකින විදියට අධ්‍යක්ෂකවරියන් ලංකාව තුළ අඩු වෙලා ඇත්තේ. ඒක මගේ පෞද්ගලික මතය.

**Gara කියන්නේ වෙනස්ම නවමු ආකාරයේ සිනමාවක් ඒ ගැනත් කියමු.**

ගරා කියන්නේ Physico සහ Thriller ආකාරයේ චිත්‍රපටියක්. ලංකාවේ ඇතුලේ ඉන්න Physico & Thriller රහට කැමති ප්‍රේක්ෂකයන් වෙනුවෙන් බිහිවෙන චිත්‍රපටියක්. මෙහි පිටපතත් මගේ අතින් නිර්මාණය වෙන්නේ. ඉතාමත්ම ගැඹුරු





මානසික ව්‍යාධි තත්ත්වයක් පිළිබඳව තමා මේ චිත්‍රපටිය කතා කරන්නේ. ඉතින් පුළුවන් තරම් ඉක්මනට අපි මේක ජනතාව අතරට ගෙනියන්න බලාපොරොත්තු වෙනවා. කලණ ගුණසේකර චමත්කා ලක්මිණී මෙහි ප්‍රධාන භූමිකා නිරූපණය කරනවා.

**වර්තමානයේ යම් අවස්ථාවලදී සිනමා නිර්මාණයකට නිෂ්පාදකවරයෙක් සොයාගන්නා විටදී ඔවුන්ගේ මතයට අනුව චිත්‍රපටි නිර්මාණ කල යුතු බව ප්‍රකාශ කරන අවස්ථා තියෙනවා. ඒ ගැන ඔබේ අදහස?**

නිෂ්පාදකවරයෙක් සොයා ගන්නා විට ඔවුන්ගේ මතයට අනුව චිත්‍රපටි නිර්මාණ කළ යුතු බවට ප්‍රකාශ කරන අවස්ථා තියෙනවා. අනිවාර්යයෙන් මේකයි චිත්‍රපටියේ නිෂ්පාදනය කියන්නේ ඒක මුදුන් මල්කඩ. එතකොට මුළු මහත් සිනමාවෙම වටිනාම චරිතය තමයි නිෂ්පාදකවරයෙක් කියන්නේ. මොකද චිත්‍රපටියකට මුදල් ආයෝජනය කරනවා කියන්නේ ඒක ලංකාවේ සිනමාව වැටිලා තියෙන කාල වකවානුවක් තුළ ඒක මහත් ලොකු කර්තව්‍යක්. ඉතින් එහෙම අවස්ථාවකදී ඔහු ඔහුගේ මුදල් ආයෝජනය කරනකොට ඔහුට මතයක් දරන්නට අයිතියක් තියෙනවා. සර්ව සම්පූර්ණ අයිතියක් තියෙනවා සහ අධ්‍යක්ෂකවරයෙක් වශයෙන් ඒ මතයට ගරු කරන්නත් අපේ අතේ වගකීමක් තියෙනවා. ඒ කියන්නේ මේ වගේ චිත්‍රපටියක් මේ වගේ එකක් වෙන්න ඕනේ. මේ වගේ කට්ටිය මේකට ඉන්න ඕනේ කියන එක නිෂ්පාදකවරයා දැකලා එහෙම යෝජනාවන් අධ්‍යක්ෂවරයාට ගෙනියන්න පුළුවන්. එතකොට අපි



අනිවාර්යෙන් නිෂ්පාදන මතයට ගරු කරන්න වුවමනයි සහ සාකච්ඡාමය වශයෙන් අදහස් හුවමාරු විය යුතුයි. නමුත් මං දකින තවත් වැරැද්දක් තමයි නිෂ්පාදකවරු ඒ කලා කෘතිය ඕනවට වඩා බලපෑමක් කලාම එතකොට ලොකු ගැටලුවක් වෙනවා.

අපි උදාහරණයක් විදිහට කියමුකෝ අපිට මේ නිර්මාණය ඇතුලේ දුම්රියක් අවශ්‍ය වෙනවා කියලා ඒක අධ්‍යක්ෂකවරයා තීරණය කරන්නේ මේකට අනිවාර්යෙන් දුම්රියක් ගේන්න ඕන කියල නමුත් නිෂ්පාදක කියනවනම් අපි මේ දුම්රිය වෙනුවට අපිට බැරිද බස් එකක් පාවිච්චි කරන්න කියලා කිව්වොතින් අන්න එතන පොඩි කලාත්මක වශයෙන් නිෂ්පාදකයාගෙන් තද බලපෑමක් එනවා. ඉතින් ඒ වගේ අවස්ථාවලදී ඒක සුහදව සාකච්ඡා කරලා විසඳගන්න පුළුවන්. ඔබ අහල තියෙන ප්‍රශ්නයට අනුව නිෂ්පාදකවරෙක්ට සර්ව සම්පූර්ණ අයිතිය තියෙනවා චිත්‍රපටිය ඇතුලේ මතයක් දරන්න.

**Dreamy World රංග පුහුණු පාසල ගැනත් කියමු.**

රංග පුහුණු පාසල අපි ඉක්මනින් පුළුවන් තරම් ඉක්මනින් පටන් ගන්න බලාපොරොත්තු වෙනවා සහ මේකට ඉදිරිපත් වෙන





ළමයින්ගෙන් පොඩි ඉල්ලීම් වගයක් තියෙනවා. ඒ නිසා තමයි අපි යම්කිසි කාලයක් පොඩ්ඩක් වැඩේ චුට්ටක් postponed කරගෙන යන්නේ. අපි ඉතා ඉක්මනින් අවස්ථාව ලැබුණු විගසම රංගනායතනය පටන් ගන්නවා. ඒ වගේම දැනට මේකේ සිලබස් කටයුතු ඒවා හැමදේම අපි තීරණය කරලත් ඉවරයි.

**ඔබ නිර්මාණය කල ඔබ සිත් ගත් ඔබේ චිත්‍රපටිය මොකක්ද?**

මං දැනට චිත්‍රපටි සම්පූර්ණ චිත්‍රපටි හතරක් නිර්මාණය කරලා තියෙනවා. දෙකක් කෙටි චිත්‍රපටි. අනිත් දෙක Lengthy චිත්‍රපටි. මම කියන්න ඕනේ මේ හැම චිත්‍රපටියක්ම මගේ සිත්ගත් දේවල් ඒවගේම මේ හැම චිත්‍රපටියකට තිර පිටපත ලියවෙන්නේ මගේ අතින්. මට මේ චිත්‍රපටි හතරම සහ ඉදිරියේදී බිහිවෙන චිත්‍රපටිත් හැමදේම එක හා සමානව සිත්ගත් චිත්‍රපටි. මොකද අධ්‍යක්ෂකවරයත් තිර පිටපත් රචකයත් කියන්නේ අම්මා කෙනෙක් තාත්තා කෙනෙක් වගේ. නිර්මාණ කියන්නේ දරුවෝ වගේ. එතකොට අපිට එහෙම එක නිර්මාණයක් සිත් ගත්තා කියලා තෝරගන්න අමාරුයි. ඕනෙම චිත්‍රපටියකට මම ආදරෙයි. හැම චිත්‍රපටියක්ම මම නිර්මාණය කරපු හැම චිත්‍රපටියක්ම එක වගේ මගේ



සිත් ගත් දේවල්.

**ඔබේ වැඩවලට කොහොමද පවුලෙන් ලැබෙන සහයෝගය?**

මම කියන්න ඕනේ මම නිදහස් හුදෙකලා තනිවම ජීවත් වෙන කෙනෙක්. මගේ පවුල ඒගොල්ලෝ මහනුවර දිස්ත්‍රික්කේ ජීවත් වෙන්නේ. එහෙම මට ලොකු සහයෝගයක් ලැබෙන්නෙත් නෑ. බාධාවන් ලැබෙන්නෙත් නෑ. මෙතනදි කියන්න ඕනේ මට මගේ පවුල වගේ ඉන්නේ මගේ පෙම්වතා. ඔහුගෙන් සෑහෙන්න ලොකු සහයෝගයක් මට ලැබෙනවා. මේ Film Industry එකේ සෑහෙන්න අසාධාරණකම් වලට මම මුහුණපාලා තියෙනවා! ඉතින් ඒ වුණු අසාධාරණකම් වලට මම උත්තර දෙන්න යන්නේ. ඒ මගේ උත්තර වලට මට help එක දෙන්නේ මගේ පෙම්වතා. පලවෙනි වතාවට මම මාධ්‍යයට කියන්නේ.මගේ ඊළඟ Film එකේ Producer මගේ පෙම්වතා. එයා ලංකාවේ සිනමාවට චිත්‍රපට නිෂ්පාදකවරයෙක් වශයෙන් එන්න යන්නේ. ඉතා ඉක්මනින්.

**අවසාන වශයෙන් අප සමඟ කතාබහකට එකතුවීම ගැන මොකද හිතෙන්නේ?**

ඇත්තටම සතුටුයි. මෙවැනි Magazine එකකින් මෙවැනි ආරාධනයක් කිරීම සම්බන්ධයෙන්. ඒ වගේම ඉදිරියේදී එන්න තියෙන අලුත්ම තොරතුරු ඉදිරියේ දෙන්න තියෙන අලුත් චිත්‍රපටි ගැන තොරතුරු සහ අලුත්ම දේවල් ප්‍රථමයෙන්ම මේ අවුරුද්දේ ප්‍රථම වතාවට ප්‍රකාශ කළේ මේ Magazine එකට. ඉතින් ස්තුතිවන්ත වෙනවා. Magazine එකට මේ ආරාධනය ලබා දුන්නට. Thank you මෙලනි ඔයාටත් ඔයා හැමදෙනාටමත්.

ස්තුතියි වින්ද්‍යා හාරිස්පත්තුව ඔබේ වටිනා අදහස්වලට. ඔබේ නවතම සිනමා නිර්මාණය සාර්ථක වෙන්න කියලා අපි ප්‍රාර්ථනා කරනවා.

**මෙලනි ග්‍රිසන්කෝටන්**

# උදයකාන්ත වර්ණසූරිය මහත්මයාගේ ගිනි අවි සහ ගිනිකෙළි 2 චිත්‍රපටියේ මමත් චරිතයක් කරනවා

දේශාන් නේරංජන



**නිරූපණ ක්ෂේත්‍රයේ වගේම රංගන ක්ෂේත්‍රයේ දිගු ගමනක් යන්න බලාපොරොත්තු වෙන ඔහු නමින් දේශාන් නේරංජන.**

**දේශාන් ඔයා ගැන හඳුන්වාදීමක් කරලම අපි කතාබහ පටන්ගමු.**

මම දේශාන් නේරංජන. ඉතින් මගේ ගම නුවරඑළිය. එතකොට මට ඉන්නවා මල්ලිලා දෙන්නෙක්. ලොකු පවුලක් නෙමෙයි ඉතින් අම්මයි තාත්තා ඉන්නවා පොඩි පවුලක්. එතකොට මම ඉස්කෝලේ ගියේ රණබිම රාජකීය විද්‍යාලයට. පේරාදෙණියේ Kandy වල. එතකොට මට දැන් වයස අවුරුදු විසි එකයි දැනට.

**ඔයා රංගන ශිල්පියෙක් වෙන්න කලින් නිරූපණ ශිල්පියෙක් එහෙම නේද?**

මම රංගන ශිල්පියෙක් වෙන්න කලින් ඇත්තටම නිරූපණ ශිල්පියෙක්. සාමාන්‍යයෙන් රංගන ක්ෂේත්‍රයට ඇවිත් අවුරුද්දක් වගේ පොඩි කාලයක් තමයි වෙන්නේ. එතකොට ඊට කලින් මගේ වෘත්තීය වුණේ නිරූපණ ක්ෂේත්‍රය. තාමත් එහෙමයි. දෙපැත්තෙම වැඩ ටික බැලන්ස් කරගෙන ලස්සනට ගමනක් යනවා.



ටීවී දෙරණ නිකිණි කුසුම් නාට්‍යයේ මාලිංගගේ චරිතයෙන් තමයි මම එන්නේ.



මම රංගන ශිල්පියෙක් වෙන්න කලින් ඇත්තටම නිරූපණ ශිල්පියෙක්.

**ඔයා රංගන ක්ෂේත්‍රයට එන්නේ කොහොමද?**

මම රංගන ක්ෂේත්‍රයට ආවේ කොහොමද කිව්වොත් ඇත්තටම මගේ ගුරුතුමා වෙන්නේ ශෙහාන් පෙරේරා මහත්මයා. ඉතින් එතුමාගෙන් තමයි මම රංගන ක්ෂේත්‍රයට එන්නේ. ඉතින් රංගනය පටන් අරගෙන අවුරුද්දක් විතර වෙනව ඒක තමයි මගේ ආරම්භය. තව මතක් කරන්න ඕනේ අනිත් දේ තමයි ටීවී දෙරණ නිකිණි කුසුම් නාට්‍යයේ අධ්‍යක්ෂක තුෂාර තෙන්නකෝන් මහත්මයාව. ඉතින් එතුමා වගේ ප්‍රවීණයෙක් එක්ක වැඩ කරන්න ලැබීම ගැනත් ගොඩක් සතුටු වෙනවා. ඉතින් ඔයාලා හැමෝටම මම ආරාධනා කරනවා නිකිණි කුසුම් නාට්‍ය බලන්න කියලා. මාලිංගගේ චරිතයෙන් තමයි මම එන්නේ.



**මං ලංකාවේ මෙච්චර කාලෙකට කරලා නැති වෙනස්ම විදිහේ වැඩ කිහිපයක් කරන්න බලාපොරොත්තු වෙනවා**

**ලාංකිය සිනමාවේ ගොඩාක් දෙනාගේ සිත් ගත්ත ගිනි කෙලි සහ ගිනි අවි චිත්‍රපටියේ දෙවන දිගහැරුමේ ඔබත් චරිතයක් රඟදක්වනවා. ඒ ගැනත් කියමු.**

ඔව්.. උදයකාන්ත වර්ණසූරිය මහත්මයාගේ ගිනි අවි සහ ගිනිකෙළි 2 චිත්‍රපටියේ මමත් චරිතයක් කරනවා. ඒක නම් ලොකු අත්දැකීමක් ගොඩක් ඇක්ෂන් තියෙන ලොකු චිත්‍රපටියක් ඒක. ඉතින් ඒ වගේ ක්ෂේත්‍රයේ ප්‍රවීණයන් සහ දැවැන්ත සිනමා නිර්මාණයක වැඩ කරන්න ලැබිච්ච එක ගැන සතුටු වෙනවා ගොඩක්ම. ඔයාලටත් දවසක ඒක බලන්න පුළුවන් වෙයි.

**අවසාන වශයෙන් මොනවද ඔයාගේ අනාගත සැලසුම්?**

අවසාන වශයෙන් කොහොමද සැලසුම් ගැන කතා කළොත් මං ඇත්තටම රංගන ක්ෂේත්‍රයට සහ නිරූපණ ක්ෂේත්‍රයට ගොඩක් ආදරය කරන කෙනෙක්. ඉතිං ඒකත් එක්ක ඉදිරියට මගේම කියලා කරන්න වැඩ කිහිපයක් සැලසුම් කරලා තියෙනවා ඉතිං ඒක ගොඩක් කල් යන්න කලින් ලඟදීම ඔයාලට බලන්න පුළුවන්. මං මොකක්ද කියලා කියන්නේ නැහැ. ඉතින් ලංකාවේ මෙච්චර කාලෙකට කරලා නැති වෙනස්ම විදිහේ වැඩ කිහිපයක් මං කරන්න බලාපොරොත්තු වෙනවා. ඉතින් ඒකට හිම්ට අඩිය තියලා තියෙනවා අපි බලමු නේද හිම්ට ඉතින්.

ඉතින් ඔහොම තමයි දේශාන් නේරංජනගේ වගතුග සහ ඔහුගේ ඉදිරි වැඩකටයුතු වෙන්නේ. ස්තූතියි! දේශාන් ඉතින් දේශාන් ඔයාලාට ඉස්සරහට ලස්සන වැඩ ටිකක් ගෙනෙයි.

**මෙලනි ෆ්‍රිසන්කෝටන්**


Dreamy World
New York Creations